**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව</u>**

**<u>2022.03.03</u>**

පැමිණීම - පැමිණීමේ ලේඛණය පරිදි වේ.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සම සභාපති හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය උපුල් ගලප්පත්ති මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු මැති ඇමතිතුමන්ලාගේ සහභාගීත්වයෙන් 2022.03.03 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වන ලදි.

ප්‍රථමයෙන්ම, ගරු සම සභාපතිතුමන් සහ මැති ඇමතිතුමන්ලා ඇතුළු පැමිණ සිටි සියලුම දේශපාලන නායකත්වය හා රාජ්‍ය නිලධාරීන් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් විසින් පිළිගන්නා ලද අතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්වීමේ වැදගත්කම පෙන්වා දෙමින් සහ එහි උපරිම ප්‍රයෝජන ලබා ගන්නා ලෙස සිහි කරමින් සභාවේ කටයුතු කරගෙන යාම සඳහා ගරු සභාපතිතුමන් වෙත අවස්ථාව ලබාදෙන ලදි.

අදාල නිලධාරීන් විසින් සාකච්ඡාවේදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කර ප්‍රගතිය ඉදිරිපත් කිරීම අනිවාර්ය වන බව ප්‍රකාශ කල අතර පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් වාර්තා නොවූ බැවින් එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලදි. අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | **පසුගිය රැස්වීමේ දී ගනු ලැබූ තීරණවල ප්‍රගතිය** | | | |
| 1.1 | සීමා නිර්ණය කමිටුව වෙත නව යෝජනා ඉදිරිපත් කිරීම | ඒකාබද්ධ යෝජනා හා වෙන්කිරීමේ යෝජනා 39ක් පමණ ලැබී ඇති බවත්, කිහිපයක් සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී එකඟ වූ බවත්, ඒවා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත් වාර්තා විය. | එකඟතාවය ලබා ගැනීමට ඇති යෝජනා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී සාකච්ඡා කර කඩිනමින් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන) / අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 1.2 | ඕකෙවෙල පොලිස් ස්ථානය ස්ථාපිත කිරීමේ දී මතු වී ඇතිගැටළු හා නව පොලිස් ස්ථානය ස්ථාපිත කිරීමේ දී ඇතිවන ගැටළු | ඕකෙවෙල පොලිස් ස්ථානයට අයත් පොලිස් බල ප්‍රදේශ නිර්ණය කර ගැනීමේ දී බෙලිඅත්ත වසම් 04ක් සඳහා විරෝධතාවයක් පැවති බැවින් එම වසම් බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේම තබා ගැනීමට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී තීරණය වූ බව වාර්තා විය. | ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙසත්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු තීරණය ලිඛිතව ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - ඕකෙවෙල / ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී - තංගල්ල |
| 1.3 | හ/යටාලතිස්ස ප්‍රාථමික විද්‍යාලයේ සිසු දරුවන් හ/දෙබරවැව ජාතික පාසලේ 06 ශ්‍රේණියට ඇතුළත් කිරීමේ ගැටළුව | පත් කරන ලද කමිටුවේ එකඟතාවය පරිදි ඉදිරි කටයුතු කරන බවට කරුණු ඉදිරිපත් විය. 6 ශ්‍රේණියේ දරුවන් සඳහා පන්ති කාමරයක් වැඩි කිරීම වසර 2ක් සඳහා පමණක් අවසර ලබා දී ඇති බව දන්වන ලදි. | දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව සලකා බලා එම කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | දකුණු පළාත් අධ්‍යාපන ලේකම් / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 1.4 | දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය ප්‍රගතිය ඉදිරිපත් කිරීම | සුහුරු වැව් ඇස්තමේන්තුවල ගැටලුවක් නොමැති බවත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු සීමාව ඉක්මවීම නිසා ප්‍රමාදයක් සිදු | එම කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - දේශගුණික සුහුරු වාරි |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | වුවද මේ වන විට අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත් වාර්තා විය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැව් 62ක් මේ වසරේ නිම කිරීමට කටයතු කරන බවට ද වාර්තා විය. | | කෘෂිකාර්මික ව්‍යාපෘතිය |
| 1.5 | කටුවන ෆයිනස් වගාව ඉවත් කිරීමේ දී දැව ප්‍රවාහනය සඳහා මාර්ග භාවිතය සම්බන්ධයෙන් කටුවන ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගැනීම | ෆයිනස් ශාක ඉවත් කර හෙක්ටයාර 9600ක භූමි ප්‍රමාණයකින් 3100ක පළතුරු වගා කර ඇති බවට වාර්තා විය. මුල් අවස්ථාවේ දී වානිජ බෝග වගාව යෝජනා වී තිබූ අතර, පළතුරු ශාක සඳහා 10% පමණ ප්‍රතිශතයක් තිබූ බවත්, සම්බන්ධීකරණ කමිටුවේ දැඩි ඉල්ලීම පරිදි එය 50% දක්වා වැඩි කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බවත් දන්වන ලදි. | ඒ අනුව ඉදිරි කටයුතු කඩිනම් කරන සෙ උපදෙස් ලබා දුනි. | දිසා වන නිලධාරී |
| 1.6 | ගව පාලනය සඳහා තෘණභූමි වෙන් කිරීම | පවතින නඩු තීන්දුව හේතුවෙන් අමර වැව ආශ්‍රිත භූමි තෘණ භූමි සඳහා ලබා දීමේ අපහසුවක් පවතින බැවින් ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ඉල්ලා ඇති බවටත්, මේ වන විට එය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදේශක කාරක සභාවට යොමු කර ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | කිරි ගව පාලනයේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රදේශ තෘණ භූමි ාලසා භාවිතා කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමින් අධිකරණයට කරුනු ඉදිරිපත් කිරීමට ඇති හැකියාව සොයා බලා කටයුතු කිරීමට වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලීමක් කරන ලෙස උපදෙස් ලබා දුනි. අමර වැව හා කඩවර වැව සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සඳහා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව වෙත යොමු කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) / ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය, ලුණුගම්වෙහෙර / ඉඩම් පරිහරණ නිලධාරී / සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ / දිසා වන නිලධාරී |
| 1.7 | ශ්‍රී ලංගම හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයත් ඇතැම් බස් රථ සවස 4.30න් පසු පරිපාලන සංකීර්ණය අසලට නොපැමිණීම හේතුවෙන් ඇතිවන අපහසුතා | සවස 4.30න් පසුව බස් රථ පරිපාලන සංකීර්ණය අසලට පැමිණීම සම්බන්ධයෙන් ලංගම බස්රථවලට උපදෙස් ලබා දී ඇති බවට කරුනු ඉදිරිපත් විය. | පෞද්ගලික බස් සේවාවන් සම්බන්ධයෙන්ධ එම කටයුතු අනුගමනය කරන ලෙසත්, ඒ පිළිබඳව පොලීසිය විසින් නියාමනය කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී - තංගල්ල / - දකුණු පළාත් අධ්‍යක්ෂ- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 1.8 | සුචි ජාතික පාසලේ වන අලි ගැටළුව | පාසලේ පවතින අවධානම් තත්ත්වය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර | ජතික වැඩසටහන යටතේ අලි වැට සංවර්ධනය වීමේ දී සියලු ප්‍රදේශ ආවරණය | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ඇති බවට කරුණු ඉදිරිපත් විය. වන අලි තර්ජන පවතින ප්‍රදේශවල අලි මෙහෙයුමක් මඟින් වන අලින් පලවා හැරීමට කටයුතු කර ඇති බවත්, අලි වැට ඉදිකිරීමේ කටයුතු කරමින් පවතින බවත් දන්වන ලදි. ඇතැම් ප්‍රදේශවල ඉඩම් නිරවුල් කර ගැනීමේ පවතින ගැටලු හේතුවෙන් කටයුතු ප්‍රමාද වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | වන බැවින්, තාවකාලික විසඳුමක් ලෙස වන අලින් පලවා හැරීම හා ආසන්නයේ කැලෑවල යටි පඳුරු ඉවත්කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට / සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ |
| 1.9 | යාල වනෝද්‍යානයේ ගැටළු | වන සතුන්ගේ නිදහස වෙනුවෙන් පැය දෙකක කාලයක් වනෝද්‍යානය වසා තබන බැවින් එම කාලයේ විවෘත කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ උපදෙස් ලබා ගත යුතු බවත්, මේ වන විට නිලධාරීන් දෙදෙනෙක් පමණක් සේවයේ යෙදෙන බැවින් තදබදයක් සහිත සති අන්තවල පමණක් දෙදෙනාම යොදවා කටයුතු කරන බවත් වාර්තා විය. සංචාරකයන් ප්‍රවාහනයේ දී රියදුරන් සිදු කරන නීති විරෝධී කටයුතු හේතුවෙන් ඔවුන්ගේ වාහන ද සමඟ තහනමට ලක් කරන බව දන්වන ලදි. සියලුම රියදුරන්ට පුහුණුවක් හා දැනුවත් කිරීමක් ලබා දුන්නද, නිරන්තරයෙන් රියදුරන් මාරු වන බැවින් ගැටලු මතු වී ඇති බවට කරුනු ඉදිරිපත් විය. | වනෝද්‍යානයේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර අවශ්‍ය තීන්දු ගැනීම සුදුසු බවට තීරණය වූ අතර, නිරන්තරයෙන් රියදුරන් පරීක්ෂා කිරීමට උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ / උද්‍යාන පාලක - යාල ජාතික වනෝද්‍යානය |
| **02** | **සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | |
| 2.1 | 2022 වර්ෂයේ හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන් | ග්‍රාම නිලධාරී වසමක් සඳහා රු.මි. 3 බැගින් වසම් 576 සඳහා රු.මි. 1728ක් ද, පළාත් පාලන කොට්ඨාසයකට රු.මි. 4 බැගින් කොට්ඨාස 153 සඳහා රු.මි. 612ක් ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් සඳහා රු.මි. 15 බැගින් මන්ත්‍රීවරුන් 7 දෙනා සඳහා රු.මි. 105ක් විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ද, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ආයෝජනය වෙනුවෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගේ හා උප සභාපතිවරුන්ගේ යෝජනා සඳහා රු.මි. 755ක් ද වශයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති බවට කරුණු ඉදිරිපත් කරන ලදි. | අදාල යෝජනා කඩිනමින් ලබා ගෙන ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් / අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | | |
| 2.2 | ගම සමඟ පිළිසඳර 2022 වැඩසටහන ප්‍රගතිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා අතරින් 2092 ක් සඳහා රු.මි. 1280.56ක් අනුමත කර ඇති බවට කරුණු දක්වන ලදි. | අනුමත කරන ලද ව්‍යාපෘතිවල කටයුතු කඩිනමින් ආරම්භ කරන ලෙස උපදෙස් ලබා දුනි. | සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 2.3 | ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ ඉදිරිපත් කරන ව්‍යාපෘති අනුමත කිරීමේ දී පැන නගින ගැටලු | ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ දී අදාල කර්මාන්තය, ව්‍යාපෘතිය නිශ්චිතව නොදැක්වීම සහ ලබා දෙන උපකරණ හෝ සේවාවන් නිශ්චිතව නොදැක්වීම හේතුවෙන් ව්‍යාපෘති අනුමත කිරීමේ දී හා ප්‍රතිපාදන වෙන් කිරීමේ දී අදාල නිලධාරීන් අපහසුතාවයට පත්වන බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති අංක MF/NPD 02/2021 හා 2021.12.15 දිනැති චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් / අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)/ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 2.4 | විමධ්‍යගත අයවැය වැඩසටහන - 2022.02.28 දිනට ප්‍රගතිය | ගරු ඇමතිවරුන් හා මන්ත්‍රීවරුන් විසින් රු.මි. 54.60ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 571ක් ඉදිරිපත් කර ඇති බවත්, තව දුරටත් රු.මි. 50.40ක වටිනාකමින් යුතු ව්‍යාපෘති ලබා දිය යුතු බවත් දන්වන ලදි. | අදාල ව්‍යාපෘති ලබා ගෙන කඩිනමින් ඉදිරි කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් / අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 2.5 | ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන ප්‍රගතිය | කලාප 03 සඳහා ක්‍රීඩා පිටි 03ක් යෝජනා කළ යුතු අතර එක් ක්‍රීඩා පිටියක් සඳහා රු.මි. 04ක් වෙන් කළ හැකි බවත්, මේ වන විට හ/ හුංගම විජයබා ජාතික පාසල යෝජනා වී ඇති බවත් තවත් පාසල් දෙකක් ඉදිරිපත් විය යුතු බවත් දන්වන ලදි. ඒ අතරින් වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට භාර දී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>ග්‍රාමීය ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම යටතේ වීරකැටිය බුද්ධියගම/ උ සුනීගතම ක්‍රීඩා පිටිය, ඕකෙවෙල ද. කණුමුල්දෙනිය ක්‍රීඩාංගනය හා බෙලිඅත්ත නායකවත්ත රාජපක්ෂ විද්‍යාලයේ ක්‍රීඩාපිටිය යන යෝජනා ඉදිරිපත් වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | අවශ්‍ය කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි | දිස්ත්‍රික් ලේකම් / අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 2.6 | සති පොල භූමි තුළ ගෘහස්ථ ක්‍රීඩා ව්‍යාප්ත කිරීමේ වැඩසටහන ප්‍රගතිය | මෙම වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10ක් සඳහා බැට්මින්ටන්, ටේබල් ටෙනිස්, කරාටේ, දාම්, චෙස් හා කැරම් වැනි ගෘහස්ථ ක්‍රීඩා සඳහා යෝජනා ඉදිරිපත් වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | අවශ්‍ය කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි | දිස්ත්‍රික් ලේකම් / අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | | |
| 2.7 | යෝජිත ගෘහාශ්‍රිත වෙළඳ ඒකක ව්‍යාපෘතිය ප්‍රගතිය | අඟුණකොළපැලැස්ස හා වීරකැටිය ප්‍රාදේශීය ලෙක්ම් කොට්ඨාසවලින් ගෘහාශ්‍රිත වෙළඳ ඒකක 81ක් තව දුරටත් ඉදිරිපත් වීමට නියමිත බවට කරුණු ඉදිරිපත් විය. | යෝජනා කඩිනමින් ලබා ගෙන ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් / අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 2.8 | සුරකිමු ගංගා ජාතික වැඩසටහන ප්‍රගතිය | වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයේ ඌරුබොකු ඔය සංරක්ෂණ ව්‍යාපෘතිය සඳහා රු.මි. 1.74ක ප්‍රතිපාදන අනුමත කර ඇති බවත්, කාර්තුමය වශයෙන් ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා වැඩ සැලැස්මක් සකස් කර එවන ලෙස ප්රාදේශීය ලේකම්ට උපදෙස් ලබා දී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | වැඩසැලැස්ම කඩිනමින් ලබා ගෙන ව්‍යාපෘතියේ කටයුතු කඩිනනමින් ආරම්භ කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් / අද්‍යක්ෂ (ක්‍රමසම්පාදන) / ප්‍රාදේශීය ලේකම් - වීරකැටිය |
| **03** | **කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ගැටලු** | | | |
| 3.1 | වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණු වීමේ රෝග මර්ධන වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම | වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය 2006 වර්ෂයේ දකුණු පළාතේ වැලිගම ප්‍රදේශයෙන් හඳනාගෙන ඇති බවත්, පයිටොප්ලාස්මා නැමති රෝග කාරකයක් හේතුවෙන් ඇති වන බවත්, මේ වන තෙක් ප්‍රතිකර්මයක් සොයා ගෙන නොමැති, රෝගී ගස් හඳුනාගෙන ඉවත් කිරීමෙන් පමණක් පාලනය කළ හැකි රෝගයක් බවට කරුනු දක්වන ලදි. කොළ කුණුවීමේ රෝගය වැලිගම රෝගයෙන් දුර්වල වන ගස්වලට දෙවනුව වැළදෙන රෝගයක් වන බවත්, දකුණු පළාතෙන් පමණක් මේ වන විට හඳනාගෙන ඇති බවත් පෙන්වා දෙන ලදි.<br>රෝග ව්‍යාප්තිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ භූමි ප්‍රතිශතය 47%ක් ලෙස හඳුනාගෙන ඇති බවටත්, බෙලිඅත්ත හා තංගල්ල ප්‍රදේශවල වැඩි ව්‍යාප්තියක් දක්නට ඇති බවටත් කරුණු ඉදිරිපත් විය.<br>මෙම රෝගය **PCR** පරීක්ෂණයක් මඟින් හඳනා ගන්නා බවත්, පාලනය කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය විසින් මේ වන විට ක්‍රියා මාර්ග ගෙන ඇති බවත් දන්වන ලදි. ඒ අනුව ඉවත් කරන පොල් ගස් සඳහා වන්දි ගෙවීමක්ත ද සිදු කරන බවත්, රෝගයට ප්‍රතිරෝදී පොල් ප්‍රභේද | දිස්ත්‍රික්කයේ පොල් වගාව ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, රෝග සම්බන්ධයෙන් ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | අංශ ප්‍රධානී - ලුණුවිල පොල් පර්යේෂණ ආයතනය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | හඳුනාගැනීම හා රසායනික ප්‍රතිකර්ම පිළිබඳව අධ්‍යයනය කිරීම මේ වන විට සිදු කරන බවත්, ප්‍රතිරෝධී ප්‍රභේදය ලෙස මේ වන විට ශ්‍රී ලංකා කොළ කුන්දිරා වර්ගය හඳුනාගෙන ඇති බවත්, වසරකට පැල 20,000ක් සිටුවීම ඉලක්කය වන බවත් පෙන්වා දෙන ලදි.<br>මීට අමතරව රතුකුරුමිනියා රෝගය, මයිටාවන් වැනි රෝග දිස්ත්‍රික්කය පුරා පොල් වගාවන්ට වැළඳී ඇති රෝග බවට පෙන්වා දෙන ලදි. පරීක්ෂණ කටයුතු සඳහා හම්බන්තොට විද්‍යාගාරයක් පවතින බවත්, මැදමුලන ප්‍රදේශයේ නව විද්‍යාගාරයක් ආරම්භ කිරීමට නියමිත බවත් පෙන්වා දෙන ලදි. | | |
| 4.2 | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ දී සාකච්ඡා වුණු වැදගත් කරුණු | 2021/22 මහකන්නයේ වී අස්වනු නෙලීම ආරම්භ කර ඇති බවත් මේ වනවිට පවතින වාර්තා අනුව අස්වැන්නේ අඩු බවක් පෙන්නුම් කරන බවත් දන්වන ලදි.<br>2022 යල කන්නය සඳහා වී, එළවළු හා පළතුරු වගාවන් ව්‍යාප්ත කිරීමට කටයුතු කරන බවත්, යල කන්නයේ අතිරේක බෝග වගාවන් හා මුං වගාව ව්‍යාප්ත කිරීමට කටයුතු කරන බවත් පෙන්වා දෙන ලදි.<br>වී වගාව සඳහා හෙක්ටයාර 37259ක ප්‍රමාණයකට කාබනික පොහොර අවශ්‍යතාවයක් පවතින බවත්, අනෙකුත් වගාවන් සඳහා ද කාබනික පොහොර ව්‍යාප්ත කිරීම සඳහා ශාකවල ආදර්ශන හා පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇති බවත් වාර්තා විය.<br>2022 වසරේ කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිත විශේෂ ව්‍යාපෘති ලෙස හරිත දැයක් ජාතික ගෙවතු වගා සංග්‍රාමය, අදර්ශ ගම්මානවල ජීවනෝපාය සංවර්ධන වැඩසටහන හා කෘෂි පාදක තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන හඳුනාගෙන ඇති බවට කරුණු ඉදිරිපත් විය. | | අධ්‍යක්ෂ - කෘෂිකර්ම |
| 4.3 | හරිත දැයක් ජාතික ගෙවතු වගා සංග්‍රාමය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් පැල තවාන් සඳහා බීජ ලබා දී ඇති බවත්, මාර්තු මාසයේ දී ගෙවතු 76587ක් සඳහා එක් අයෙකුට පැල 40 බැගින් ප්‍රතිලාභීන්ට පැල ලබා දීමට කටයුතු කරන බවත් දන්වන ලදි. හුවමාර්ග ක්‍රම මඟින් බෝග ව්‍යාප්ත කරගැනීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බවට කරුනු දක්වන ලදි.<br>අතිරික්ත නිෂ්පාදන විජලන ව්‍යාපෘති හා අනෙකුත් නිෂ්පාදන යෝජනා වාර්තා ඉදිරිපත් කර ඇති බවට කරුණු දක්වන ලදි. | හරිත කෘෂිකර්මාන්තයක් ව්‍යාපෘති නිර්නායකවලට අනුකූලව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුන් අතර, පැල තවාන් සඳහා ගෙවීම් කිරීමට පමණක් ගම සමඟ පිළිසඳරක් වැඩසටහනේ ජීවනෝපාය සංවර්ධනය සඳහා වෙන්වූ ප්‍රතිපාදන මඟින් සිදු කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) / අධ්‍යක්ෂ - කෘෂිකර්ම / අධ්‍යක්ෂ - සමෘද්ධි |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 4.4 | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට වාර්තා වී මෙතෙක් නොවිසඳුන ගැටලු | 01. බඳගිරිය ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් අලුත්වැව යටතේ පෝෂණය වන කුඹුරු ඉඩම්වලින් කොටසක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ලෙස සීමා ලකුණු කිරීම | ප්‍රාදේශීය මට්ටමින් සාකච්ඡා කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | අධ්‍යකෂ - කෘෂිකර්ම / සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ |
| | | 02. අඳගල වැල්ල මෝදර පැලැස්ස විදුලි වැට ඉදිකිරීමට බාධා ඇතිවීම | අදාල ප්‍රදේශයට වනජීවී දෙපාර්තමේන්තුවට අයත් නිසා අභිමතය පරිදි කටයුතු කළ හැකි බැවින් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ |
| | | 03. බඳගිරිය වැව රක්ෂිත කලාපය අනවසර වගා කරුවන්ගේ ග්‍රහනයට නතු වීම | වැව තුළ වගා කටයුතු නතර කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හැකියාවක් පවතින බැවින් මැනුම් නියෝගයක් මඟින් ගැටලු විසඳා ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | වාරිමාර්ග අධ්‍යක්ෂ |
| | | 04. මලලආර මඟින් පෝෂණය වන වැව් හා කුඹුරු ඉඩම් සඳහා නිසි ජල කළමනාකරණයක් සිදු කිරීමට නොහැකි වීම | පොම්ප මඟින් ජලය ලබා ගන්නා අයට අවභාග කටයුතු සිදු කරන ලෙසත්, වෙනම ඇලක් මඟින් ජලය ලබා දීමට සකස් කරන ලද ඇස්තමේන්තුව ජල සම්පාදන මණ්ඩලයට ඉදිරිපත් කර ඉදිරි කටයුතු සිදු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ - වාර්මාර්ග / ප්‍රාදේශීය කළමනාකරු - ජල සම්පාදන මණ්ඩලය |
| | | 05. බූන්දල ප්‍රදේශයේ ආරම්භ කරන ලද විදුලි වැට ප්‍රදේශවාසීන් කිහිපදෙනෙකුගේ විරෝධතා මත අතරමග නැවතීම | ගොවීන්ට වගා බිම් සඳහා ඇතුළු වීමට Spring Gate එකක් ලබා දී ගැටලු නිරාකරණය කරගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ |
| **05** | **වාරිමාර්ග ක්ෂේත්‍රයේ ගැටලු** | | | |
| 5.1 | බූන්දල ගොඩගහවැව සංවර්ධනය කිරීම දේශගුණික සුහුරු ව්‍යාපෘතිය හරහා සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම | සුහුරු ව්‍යාපෘතිය මඟින් දැනට තොරාගෙන ඇති ප්‍රතිසංස්කරණය කිරීමට නියමිත වැව් 10ට අමතරව මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීමට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡා වූ බවට කරුණු ඉදිරිපත් විය. | කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර ව්‍යාපෘතියට යෝජනාවක් ලෙස ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / නියෝජ්‍ය අධ්‍යක්ෂ - දේශගුණික සුහුරු ව්‍යාපෘතිය |
| 5.2 | කරගස්ආර බස්නාව ශුද්ධ නොකිරීම හේතුවෙන් මතු වී ඇති ගැටලු | කරගස්ආර බස්නාව ශුද්ධ කර ඇලවේලි සෑදීම හා පයිප්ප වැසීමට දොරවල් යොදා සංවර්ධනය කර දෙන ලෙස සුහද ගොවි සංවිධානයේ ගොවීන් විසින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත්, | ගම සහභ පිලිසඳරක් වැඩසටහන යටතේ ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | මේ සඳහා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බවත් දන්වන ලදි. | | |
| 5.3 | ප්‍රතිසංස්කරණය කරන ලද නමඩගස් වැව මායිම් ලකුණු නොකිරීම හා ජලජ පැලෑටි ඉවත් නොකිරීමෙන් මතු වී ඇති ගැටලු. | ජලජ පැලෑටි ඉවත් කිරීමේ යන්ත්‍රයක් මඟින් නඩත්තු වියදම පමණක් ගෙවා වැව පිරිසිදු කළ හැකි බවට කරුණු ඉදිරිපත් විය. | වාරි සෞභාග්‍යා වැඩසටහන මඟින් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - සූරියවැව |
| **06** | **ඉඩම් ක්ෂේත්‍රයේ ගැටලු** | | | |
| 6.1 | විශේෂ කාර්ය බලකාය මඟින් ගොවිපලක් ලෙස ආරම්භ කිරීම සඳහා අඟුණකොළපැලැස්ස පෝරුව් ඉඩම ලබා ගැනීම | ගුරුවෙල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අක්කර 5ක පමණ රජයට අයත් ගොඩනැගිලි 5කින් සමන්විත ඉඩම වගා කටයුතු සඳහා විශේෂ කාර්ය බලකාය වෙත ඉල්ලා ඇති බවත් ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදි. | ව්‍යාපෘති වාර්තාවක් ලබා ගෙන වගා කටයුතු සඳහා පමණක් තාවකාලිකව ලබා දෙන ලෙස උපදෙල් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - අඟුණකොළපැලැස්ස |
| 6.2 | කොළඹ විශ්වවිද්‍යාලයේ වැලිගත්ත කෘෂි පීඨය සඳහා උද්දකන්දර ප්‍රදේශයෙන් ඉල්ලා ඇති අක්කර 250ක ඉඩම ලබා ගැනීම | උද්දකන්දර පිහිටි ඉඩම කෘෂි පර්යේෂණ සඳහා සුදුසු පසක් පවතින බැවින් පවතින ජල ප්‍රශ්නය විසඳාගෙන හෝ ඉදිරි කටයුතු කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදි.<br>මෙම ඉඩම වන රක්ෂිතයක් ලෙස ගැසට් කිරීම සඳහා යොමු කර ඇති බැවින් රන්මිණිතැන්න ප්‍රදේශයේ පවතින ඉඩමෙන් නිදහස් කර හැකි බවට කරුණු ඉදිරිපත් විය. | උද්දකන්දර ඉඩම රක්ෂිතයක් ලෙස ගැසට් නොකරන ලෙසත්, එම අක්කර 250 භූමිය විශ්වවිද්‍යාලයට ලබා දෙන ලෙසත් උපදෙස් ලබා දුනි. | දිසා වන නිලධාරී / උපකුලපති - කොළඹ විශ්වවිද්‍යාලය |
| 6.3 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රන්මිණිතැන්න ප්‍රදේශයේ ඉඩම පොලිස් විශේෂ කාර්ය බලකාය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ගුවන් හමුදාව යන ආයතන සඳහා වගා කටයුතු වෙනුවෙන් ලබා ගැනීමට අනුමැතිය ලබා ගැනීම | පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ඇතිවිය හැකි ආහාර හිඟයටද පිළියමක් ලෙස ශ්‍රමය හා භෞතික සම්පත් යොදාගෙන ගොවිතැන් කටයුතු කළ හැකි රජයේ ඉඩම් හම්බන්තොට, තිස්සමහාරාම, ලුණුගම්වෙහෙර, වීරකැටිය, අම්බලන්තොට, තංගල්ල හා සූරියවැව යන ප්‍රදේශවලින් ලබා ගැනීමට අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් විය. නෙටොල්පිටිය හා රන්මිණිතැන්න ප්‍රදේශවල සුදුසු ඉඩම් හඳුනාගෙන ඇති බවට කරුණු ඉදිරිපත් විය. | එම ඉඩම් වගා කිරීමේ පදනම මත තාවකාලිකව ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදි. | අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් / අණදෙන නිලධාරී- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව / අණදෙන නිලධාරී- විශේෂ කාර්ය බලකාය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 6.4 | හම්බන්තොට මහනගර සීමාවේ හා මහවැලි ප්‍රදේශවල අනවසර ගොඩකිරීම් හා ඉදිකිරීම් හේතුවෙන් මතු වී ඇති ගැටලු හා එම ඉඩම් නාගරික සංවර්ධන අධිකාරියේ සැලැස්මට ඇතුලත් කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම | මහනගර සීමාවේ අති ඉඩම් අනවසරයෙන් ගොඩකිරීම හේතුවෙන් ගැටලු මතු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. එම ඉඩම් නගර සැලැස්මට ඇතුලත් නොවීම ඊට හේතු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | නගර සහා සීමාවන් පුලුල් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත්, නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම්වලට ඇතුලත් කර ගන්නා ලෙසත් උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 6.5 | යායවත්ත පොදු සුසාන භූමිට සඳහා වෙන් කර ඇති ඉඩම හා ගොවිතැනි කටයුතු සිදුකරන ඉඩම් නිරවුල් කර ගැනීම | තංගල්ල මැදගම ග්‍රාමනිලදාරී වසමේ යායවත්ත ප්‍රදේශයේ අක්කර 02ක ඉඩමක් සුසාන භූමියක් සඳහා වෙන් කර ඇති තිබූ අතර ප්‍රදේශවාසීන් මෘත දේහ භූමදානය කිරීමේ දී ඊට විරුද්ධව පැමිණිල්ලක් කර ඇති බවට කරුණු ඉදිරිපත් විය.තව ද වසර ගණනාවක් තිස්සේ ගොවිතැනි කටයුතු සිදුකරන ලද අක්කර 73ක පමණ ඉඩම සම්බන්ධයෙන් ද ගැටලු පවතින බවට කරුණු ඉදිරිපත් විය.<br>අක්කර 20 ඉඩම පුහුණු ආයතනයක් සඳහා රුහුණු සංවර්ධන පදනම වෙත ලබා දී ඇති බවටත්, පුහුණු ආයතනය මේ වන විට ක්‍රියාත්මක නොවන බවටත්, සුසාන භූමියට වෙන් කර ඇති අක්කර 2 එම අක්කර 20ට අයත් නොවන බවටත් කරුණු ඉදිරිපත් වූ අතර, ඉඩම නිශ්වය කර ගැනීම සඳහා මැනුමක් ඉල්ලා ඇති බව ප්‍රකාශ කරන ලදි. | දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව/ප්‍රාදේශීය ලෙක්ම් හා අදාල අනෙකුත් නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරන ලෙසත්, ඉඩම වෙන් කරන ලද කාරණාව සම්බන්ධ අරමුණු ඉටුවෙනවාද යන්න පිළිබඳ වාර්තාවක් මීළඟ කමිටුවට ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ලේකම් / සභාපති - තංගල්ල ප්‍රාදේශීය සභාව/ ප්‍රාදේශීය ලේකම් - තංගල්ල / මිනින්දොරු අධිකාරී |
| **07** | **ජල සම්පාදන ක්ෂේත්‍රයේ ගැටලු** | | | |
| 7.1 | ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින ගැටලු | ඇතැම් ජල ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රවේශ වීමේ ගැටලු පවතින බවත්, ප්‍රාදේශීය රසායනාගාරයක් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම නිදහස් කර ගැනීමේ අවශ්‍යතාවයක් පවතින බවත්, ප්‍රකාශ කරන ලදි. | ව්‍යාපෘති සඳහා ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදි. වියලි කලාපීය උද්භිද උද්‍යානය අසල ඉඩම රසායනාගාරය සඳහා යොදා ගන්නා ලෙසත්, කාර්යාලය සඳහා | ප්‍රාදේශීය කළමනාකරු - ජල සම්පාදන මණ්ඩලය / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | පරිපාලන සංකීර්ණයේ දෙවන අදියරෙන් ලබා දීම සඳහා අවශ්‍යතාවය නාගරික සංවර්ධන අධිකාරියට ලබා දෙන ලෙසත් උපදෙස් ලබා දුනි. | අධිකාරිය |
| 7.2 | ජල මූලාශ්‍ර ගැටලු | මුරුතවෙල ජලාශයේ ජලය පරිභෝජනයට සුදුසු මට්ටමේ පවතින බැවින් වීරකැටිය ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා අමු ජලය ලබා ගැනීම කඩිනම් කරගැනීම අවශ්‍ය බවට කරුණු දක්වන ලදි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුන් අතර, ඒ පිලිබඳව අධ්‍යයනය කර ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | ප්‍රාදේශීය කළමනාකරු - ජල සම්පාදන මණ්ඩලය / වාරිමාර්ග අධ්‍යක්ෂ |
| **08** | **වන ජීවී හා වන සංරක්ෂණ ක්ෂේත්‍රයේ ගැටලු** | | | |
| 8.1 | අලි මිනිස් ගැටුම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර සාකච්ඡා කිරීම | අලි වැට ඉදිකිරීමේ කටයුතු බොහෝදුරට අවසන් කර ඇති බවත්, පවතින වැට ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බවත්, විදුලිවැට මාර්ග එලි පෙහෙලි කිරීම සඳහා ප්‍රතිපාදන ලැබී ඇති අතර එම කටයුතු ද සිදු කරමින් පවතින අතර හේන් වගා හේතුවෙන් ගැටලු පවතින බවත් ප්‍රකාශ කරන ලදි.<br>අලි මෙහෙයුමක් මඟින් වන අලි රක්ෂිතවලට පන්නා ඇති අතර, රක්ෂිතවල ප්‍රමාණවත් ආහාර නොමැති වීම හේතුවෙන් රඳවා තබා ගැනීමේ අපහසුවක් පවතින බව හා ඊට අදාල විසඳුම් සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන බව පෙන්වා දෙන ලදි. | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී ද සාකච්ඡා කර හේන් ගොවීන්ටද සාධාරණයක් වන පරිදි සුදුසු කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ |
| 8.2 | ගොඩවාය මානප්ජාව ප්‍රදේශයේ වන අලි ගැටලුව | හම්බන්තොට වරාය ආසන්නයේ කැලෑ තුල සැඟවී සිට වන අලි ගොඩවාය, මානප්ජාව ප්‍රදේශවලට ඇතුලු වන බවට කරුණු ඉදිරිපත් විය. | ඒ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ - වනජීවී දකුණ |
| **09** | **වෙනත් ගැටළු** | | | |
| 9.1 | "රටකි දැයකි ඇය" තේමාව යටතේ මෙවර ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පවත්වන | 2022.03.08 වන දිනට යෙදී ඇති කාන්තා දිනය සැමරීමේ ජාතික උත්සවය කොළඹ ජාත්‍යන්තර බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන බවත්, ඊට සමගාමීව හම්බන්තොට දිස්ත්‍රික්කයේ තොරාගත් සාර්ථක කාන්තා ව්‍යවසායකයින් ඇගයීමේ වැඩසටහනක් 2022.03.015 වන දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බවත්, ඊට අමතරව 2022.03.11 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාන්තා නිලධාරීන් සඳහා සුවනාරී සායනයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බවත් දැනුම් දෙන ලදි | | වනිතා සංවර්ධන නිලධාරී |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීම | | | |
| **10** | **පසුව ලැබුණු ලිපි** | | | |
| 10.1 | හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා ගැනීම | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වලව කලාපයේ 2022 වසර සඳහා යෝජිත ව්‍යාපෘති ලයිස්තුවක් ඉදිරිපත් කරන ලදි. | ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දුනි | නේවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 10.2 | රොන් මඩ ඉවත් කිරීම සඳහා වන සුළු වාරිමාර්ග වැව් යෝජනා ලයිස්තුව ඉදිරිපත් කිරීම | හම්බන්තොට දිස්ත්‍රික්කයේ බොහෝ සුළු වාරිමාර්ග වැව් රොන් මඩ පිරීම හේතුවෙන් ධාරිතාවය අඩු වී ඇති බවත්, දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් රොන් මඩ ඉවත් කිරීම සඳහා සුදුසු වැව් තෝරා ලේඛනයක් සකස් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | ඊට අදාල කටයුතු සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් කමිටුවේ සියලුම සාමාජිකයන් වෙත ස්තුතිය පලකරමින් ප.ව 12.30ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

එච්.පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

**එච්.පී.සුමණසේකර**
**දිස්ත්‍රික් ලේකම්/ දිසාපති**
**හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය**

2022 මාර්තු මස ...17........... දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.